රාජ්‍ය දැව සංස්ථාව
වනජීවි හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

## ලංසු සඳහා ආරාධනාවයි

රාජ්‍ය දැව සංස්ථාව වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා මුද්‍රිත මිල ගණන් කැඳවනු ලැබේ.

| ලංසු අංකය | ලංසු නාමය හා ස්ථානය | ඇස්තමේන්තු කල පිරිවැය හා (අවිනිශ්චිත මුදල හා බදු රහිත) රු. මිලියන | ICTAD/CIDA වර්ගීකරණය | ලංසු බැදුම්කරයේ වටිනාකම හා ලබා දිය යුතු කාලය | ආපසු නොගෙවන තැන්පතුව (රු.) |
|---|---|---|---|---|---|
| STC/04/CE/ Con/193 | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධති 12ක් අළුත්වැඩියා කිරිම රාජ්‍ය දැව සංස්ථාව, බත්තරමුල්ල. | 12.78 | C7, C6 සහ C5 ශ්‍රේණි යටතේ ගොඩනැගිලි සඳහා CIDA ලියාපදිංචිය | **රු.130,000.00** (දින 105) **2024.01.19** සිට **2024.05.02** දක්වා | 2,000.00 |

1. ලංසු කැඳවීම, **ජාතික තරගකාරි ලංසු ක්‍රමය (NCB)** මගින් සිදු කරනු ලැබේ.

2. මේ සම්බන්ධව උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නිෂ්පාදන හා ඉංජිනේරු)** වෙත ලිඛිතව ඉල්ලුම් කිරිමෙන් හා ඉහත සඳහන් ආපසු නොගෙවන මුදල, රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති නමින් මුදලින් පමණක් ප්‍රධාන කාර්යාලයේ මුදල් කවුළුව වෙත ගෙවීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස්කර ඇති අදාල ලංසු කැඳවීමේ ලේඛණ කට්ටලයක් 2024.01.01 දින සිට 2024.01.18 වන දින දක්වා සතියේ රාජකාරි දින වල **පෙ.ව. 09.00** සිට **ප.ව 03.00** දක්වා මිලදී ගත හැකිය.

3. වෙන වෙනම ලිපි කවර වල මුද්‍රා තැබූ නිසියාකාරව සම්පූර්ණ කරන ලද ලංසුව හා එහි පිටපත, මුද්‍රා තබන ලද තනිකවරයක නැවත බහා රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් හෝ **සභාපති, ප්‍රසම්පාදන මණ්ඩලය, රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් **2024.01.19** දින **පෙ.ව. 10.30** ට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරිම, **2024.01.19** වන දින **පෙ.ව. 10.30** ට සිදු කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයකුට සහභාගී විය හැකිය.

4. ඉහත වගුවේ සඳහන් පරිදි සියළුම ලංසු බැඳුම්කර, පිළිගත් වාණිජ බැංකුවකින් හෝ ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලින් (CGF) ලබා ගත් ලංසු බැඳුම්කරයක්විය යුතු අතර එම බැඳුම්කරවල **"කොන්දේසි විරහිත හා ඉල්ලූ විට ගෙවීම්"** යන්න සඳහන් විය යුතුය. මෙහි සම්මත ආකෘති පත්‍රය, ලංසු ලියකිවිලි සමග අමුණා ඇත. නියමිත ආකෘතියට පරිභාහිරව ඇති සියළුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. 2023.02.09 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛණ අංක 04/2016 (iv) යටතේ මූල්‍යාමය වශයෙන් ඇගයීමේදී එහි සඳහන් කරුණු අනුව ඇගයීම් කරනු ලැබේ.

6. මේ සම්බන්ධව උනන්දුවක් දක්වන හා සුදුසුකම්ලත් ලංසුකරුවන්ට **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නිෂ්පාදන හා ඉංජිනේරු), අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල** යන කාර්යාලයෙන් **2024.01.01** දින සිට **2024.01.17** වන දින දක්වා සතියේ රාජකාරි දින වල **පෙ.ව. 09.00** සිට **ප.ව 03.00** දක්වා ලංසු ලිපි ලේඛණ පරික්ෂා කල හැකිය.

7. පෙර ලංසු සාකච්ජා කිරීමේ රැස්විම, 2024.01.10 දින පෙ.ව.11.00 ට ප්‍රධාන කාර්යාලයේ ඉංජිනේරු හා න්ෂ්පාදන අංශයේදි පැවැත්වෙන අතර ඒ සඳහා සහභාගි විය හැකිය.

   දුරකථන අංකය: **011-2866614**

**සභාපති,**
**ප්‍රසම්පාදන මණ්ඩලය**
**රාජ්‍ය දැව සංස්ථාව,**
**අංක 82, රජමල්වත්ත පාර,**
**බත්තරමුල්ල.**